**ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සලසා නොගෙන මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම යටතේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (237-1-1-0-2002-0/11) සඳහා මු.රෙ 66 මඟින් රු.834,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. | 2023 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව තුළ 237-01-01-2002 (11) වැය විෂය යටතේ ප්‍රතිපාදන වෙන්කර නොතිබූ අතර, 2023 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු පිළියෙල කළ කාල වකවානුව වන විට (2022 ජූලි - අගෝස්තු) මෙම දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර උපකරණ සක්‍රීය මට්ටමේ පැවති බැවින් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමේ අවශ්‍යතාවයක් ඇති වී නොමැත. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වීම. |
| (ආ) | මූලික ඇස්තමේන්තුවෙන් ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන වෙන් කර නොගෙන වැය විෂයයන් 02 ක් සඳහා එකතුව රු.36,212,297 ක්, පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන හා මු.රෙ. 66 මඟින් අමතර ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර, එය එම වැය විෂයන්ගේ මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 33 සිට 527 ක් දක්වා වූ පරාසයක් විය. | ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන යටතේ අනුයුක්තව සිටි නිලධාරීන් දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කිරීම හා 2023 අයවැය ඇස්තමේන්තුව පිළියෙල කරන විට විදේශ ගමන් වියදම් සඳහා රු.7,500,000 ක් ඉල්ලුම් කළ ද අයවැය දෙපාර්තමේන්තුවෙන් වෙන් කර ඇත්තේ රු.500,000 ක් පමණි. | - එම - |
| (ඇ) | ලෝක ආහාර වැඩසටහන (WFP), දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා 2023 වර්ෂයේදී වැය විෂය අංක 237-1-2-2-2202-0/13 සඳහා රු.1,250,000,000 ක් ද, වැය විෂය අංක 237-1-2-2-2202-0/17 යටතේ රු.550,000,000 ක් වශයෙන් එකතුව රු.1,800,000,000 ක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා දී තිබුණ ද, 2023 වර්ෂයේදී මෙම වැඩසටහන, ජනාධිපති කාර්යාලය මඟින් ක්‍රියාත්මක කිරීමට තීරණය කර, ඒ සඳහා ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂයට අතිරේක ප්‍රතිපාදන සලසා දී තිබුණ ද, දෙපාර්තමේන්තුවේ ඉහත වැය විෂයන් දෙක සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන එකතුව වූ රු.1,800,000,000 ක මුදල් ප්‍රමාණය නියමිත පරිදි අවුරා තැබීමක් සිදු වී | 2023 වර්ෂයට අදාළව පාර්ලිමේන්තුවේ 2023 අයවැය අනුමත වීමෙන් පසුව, ජනාධිපති ලේකම්ගේ ඉල්ලීම පරිදි WFP ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ජනාධිපති ලේකම් කාර්යාලය මගින් සිදු කිරීමට තීරණය කිරීම නිසා 2023 වර්ෂයේ වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝජනයෙන් තොරව ඉතිරි වී ඇත. මේ සම්බන්ධයෙන් අයවැය දෙපාර්තමේන්තුව විසින් 2023.01.23 දිනැති ලිපියෙන් අවුරා තබනු ලබන බව දන්වා ඇත. එබැවින් එම ප්‍රතිපාදන අප දෙපාර්තමේන්තුව යටතේ අවුරා තබා ඇත. මෙම සිදුවීම මෙම දෙපාර්තමේන්තුවෙන් පරිබාහිර කාර්යයක් බව දන්වනු කැමැත්තෙමි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වීම හා අයවැය ප්‍රතිපාදන විධිමත්ව උපයෝජනයට කටයුතු කළ යුතු වීම. |

නොතිබුණි. ඒ අනුව, ඉහත වැය විෂයන් දෙක යටතේ වූ මුළු ප්‍රතිපාදන ප්‍රමාණයම ඉතිරිවීම් ලෙස දක්වා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 විදේශ ආධාර ව්‍යාපෘති

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව යටතේ විදේශ ණය/ ආධාර යොදවා ක්‍රියාත්මක කරන ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය යටතේ වැය විෂය අංක 237-1-1-20-2106-0/13 සඳහා 2023 වර්ෂයේදී වෙන් කරන ලද රු.34,788,249 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනයෙන් තොරව ඉතිරි වී තිබුණි. | ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය යටතේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ CRM පද්ධතිය වැඩිදියුණු කිරීමට නියමිතව තිබුණි. කෙසේ නමුත් අස්වැසුම යටතේ සහනාධාර ගෙවීම වාණිජ බැංකු හරහා සිදු කරන ලද බැවින්, සහනාධාර ගෙවීමේ ක්‍රමවේදය (System) CRM පද්ධතිය මගින් සිදුකිරීම එම අවස්ථාවේදී අවශ්‍ය නොවීය. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ප්‍රතිපාදන වෙන් කළ යුතු බව හා ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනීම සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන, කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතු වීම. |
| (ආ) | ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන්කිරීමේදී වැරදි වැය විෂයයන් යටතේ ප්‍රතිපාදන සලසා තිබීම, ව්‍යාපෘති අවසානයේදී බිල්පත් පියවීම හා ඇස්තමේන්තු කරනු ලැබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම වැනි හේතු මත ව්‍යාපෘති 04 ක් සඳහා මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා නොගෙන වැය විෂයන් 11 ක් සඳහා එකතුව රු.21,248,932,166 ක් සමාලෝචිත වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන හා මු.රෙ. 66 මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. | ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතියේ නිවැරදි වැය විෂයය යටතේ ගිණුම්ගත කිරීමට සිදුවීම, අවිනිශ්චිත හා හදිසි ප්‍රතිචාර සංරචක ව්‍යාපෘතියේ (CERCs) බිල්පත් ගෙවීම, ශ්‍රී ලංකාවේ වෙළඳපල සන්ධානය (PALAM/A) ව්‍යාපෘතිය හරහා විදේශ ප්‍රදාන (13) සඳහා 2023 වර්ෂයේදී මෙරටට ලැබෙන ආධාරවල මූල්‍ය වටිනාකම රු.මි.873ක් පමණ වන බව ඇස්තමේන්තු කර තිබීම හා ද්‍රව්‍යමය ආධාර තොග වරායෙන් නිදහස් කර ගැනීම සඳහා බදු හා ගාස්තු ගෙවීමට සිදු වූ බැවින් ද, සමාජ ස්ථාවරත්වය පිහිටුවීම ව්‍යාපෘතියට අදාළ පොහොර ආනයනය කිරීම සඳහා එක් සැපයුම්කරුවෙකු විසින් අදාළ ලියකියවිලි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් 2022 වර්ෂය තුළ අවසන් කිරීමට නොහැකි වීම හේතුවෙන් පරිපූරක ඇස්තමේන්තු හා මු.රෙ.66 මගින් ප්‍රතිපාදන වෙන් කර ගැනීමට සිදු විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරනු ලබන ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය හා ශ්‍රී ලංකාවේ වෙළඳපල සංධානය (PALAM/A) ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන එකතුව වූ රු. 8,902,500,000 කින් එකතුව රු. 7,443,648,823 ක් එම ව්‍යාපෘතිවල වෙන් කරන ලද වැය විෂයයන්ගෙන් වෙනත් වැය විෂයයන් සඳහා මාරු කර තිබුණි. එම මාරු කරන ලද ප්‍රමාණය වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් සියයට 82 ක සිට සියයට 100 ක පරාසයක පැවතුණු අතර, වැරදි වැය විෂයයන් යටතේ වූ ඇස්තමේන්තු ප්‍රතිපාදන සිදු කර තිබීම හා ප්‍රතිපාදන අවශ්‍ය නොවීම වැනි කරුණු මේ අයුරින් ප්‍රතිපාදන මාරු කිරීමට බලපා තිබුණු බව නිරීක්ෂණය විය. | ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතියේ නිවැරදි වැය විෂයන් යටතේ ගිණුම් ගත කිරීම සඳහා, මු.රෙ.66 අනුව ප්‍රතිපාදන මාරු කරන ලදි. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මෘදුකාංග පද්ධතිය සංවර්ධනය සඳහා ප්‍රතිපාදන සලසා ගැනිණි. පසුව මෙය කාලීන අවශ්‍යතාවයක් නොවුණි.<br>PALAM/A ව්‍යාපෘතිය යටතේ ලබාදෙන ද්‍රව්‍යමය ආධාර සහ එම ද්‍රව්‍ය ආධාර රේගුවෙන් නිදහස් කර ගැනීමට අදාළ වියදම් නිවැරදි වැය විෂය යටතේ ගිණුම්ගත කළ යුතු බැවින් මු.රෙ.66 අනුව ප්‍රතිපාදන මාරු කරන ලදි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වීම. |

## 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ආයතන වෙත රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දීම පිළිබඳව වූ 2018 ඔක්තෝබර් 23 දිනැති අංක 05/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ප්‍රසම්පාදන අස්ථිත්ව, මිල සැඳහුම් ක්‍රමයට ප්‍රසම්පාදන කිරීමේදී විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කළ යුතු වුවද, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේදී අවස්ථා 14 ක දී එකතුව රු.2,008,935 ක් වූ භාණ්ඩ ප්‍රසම්පාදනයන් විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීමෙන් තොරව මිල සැඳහුම් ක්‍රමයට සපයාගෙන තිබුණි. | 2023 වර්ෂයේ 05/04 දින මෙම පද්ධතිය භාවිතය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන ලේකම් කාර්යාලය විසින් ආරම්භ කරන ලද අතර 2023 වර්ෂයේ විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතය පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් නිලධාරීන් සතුව නොතිබුණි. එහෙත් 2024 වසරේ සිට මෙම පද්ධතිය හරහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කර ඇත. | ප්‍රසම්පාදන සිදු කිරීමේදී අදාළ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3.3 වත්කම් කළමනාකරණය**

**3.3.1 වාහන**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සතු වාහන 04 ක් දෙපාර්තමේන්තුවේ භාවිතය සඳහා යොදවා නොගෙන මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත විධිමත් පවරා දීමකින් තොරව ලබා දී තිබුණි. | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ රාජකාරි අවශ්‍යතාවය අනුව නැවත එම වාහන දෙපාර්තමේන්තුව වෙත ලබා ගනු ලැබේ.<br>මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත තාවකාලිකව ලබා දුන් WP KQ-6923 දරන රථය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ රාජකාරි සඳහා නැවත ලබා ගන්නා ලදි. | විධිමත් පරිදි වාහන පවරා දීමට හෝ එසේ නැතහොත් නැවත දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතු විම. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ මෝටර් රථ දෙකක් සමාලෝචිත වර්ෂයේදී අනතුරට භාජනය වී, 2024 අප්‍රේල් 10 දින වන විට පිළිවෙලින් මාස 08 ක් හා මාස 04 ක කාල සීමාවක් ගතවී තිබුණ ද අදාළ මොටර් වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ 104(4) ප්‍රකාරව පූර්ණ වාර්තාවන් ඉදිරිපත් කර නොතිබුණ අතර මෝටර් රථවලට සිදු වූ අලාභය අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු WP KQ 6923 දරන රථයේ අලුත්වැඩියා කටයුතු අවසන් වූ පසු, හා අංක WP KP 5871 දරන රථයේ 2023.12.21 දින අනතුර සම්බන්ධව පත්කර ඇති පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව ලද පසු මු.රෙ 104(4) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ලැබේ.<br>මෙම WP KP 5871 හා WP KQ 6923 දරන මෝටර් රථ 02 සම්බන්ධයෙන් පැවැත්වෙන මු.රෙ 104 අනුව අවසන් පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | මෝටර් රථ අනතුරු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කඩිනමින් කටයුතු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණනය සඳහා ඉදිරිපත් කරන ලද කාර්යමණ්ඩල දත්ත අනුව 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව 28 ක් වූ අතර, පුරප්පාඩු පිරවීමට හෝ අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කිරීමට සමාලෝචිත වර්ෂයේදී පියවර ගෙන නොතිබුණි. | එකඟයි. | විධිමත් පරිදි කටයුතු කර පුරප්පාඩු පුරවා ගැනීම හෝ සේවක සංඛ්‍යාව යාවත්කාලීන කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |